අංක 01 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද, වැරදි නම් (×) වැරදි ලකුණ ද ඉදිරියෙන් යොදන්න.

01. ඉහළ අධිකරණයේ විනිසුරුවන් පත්කරන්නේ ජනාධිපතිවරයා ය. ( )

02. ශ්‍රී ලංකාවේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ,නීතිපතිවරයා ය. ( )

03. පළාත්බද මහාධිකරණය පිහිටුවන ලද්දේ, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන වන සංශෝධනය පදනම් කරගෙනය. ( )

04. රාජ්‍යය සම්බන්ධ නඩුවලදී අවශ්‍ය නීති උපදෙස් ලබාදීම නීතිපතිවරයාගේ කාර්යයක් නොවේ. ( )

05. නීතිය මිනිසාගේ බාහිර හැසිරීම පාලනය කරන අතර, යුක්තිය මිනිස් හැගීම් සමඟ සම්බන්ධ වූවකි. ( )

06. අපරාධ නඩුවක පැමිණිලිකරුවීමට රජයට නොහැකිය. ( )

07. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාව අධිකරණ දිස්ත්‍රික්ක පහකට බෙදා තිබුණි. ( )

08. ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රධානියා අග්‍රවිනිශ්චයකාරවරයාය. ( )

09. රටක මූලික නීතිය වන්නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. ( )

10. නීතිය නොදැන සිටීම නිදහසට කරුණක් නොවේ. ( )

LIVEWORKSHEETS